www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# වර්ජිත රූපවාහිනී සේවකයන් මර්දනය කිරීමට ශ්‍රී ලංකා ආන්ඩුව මිලිටරිය යොදවයි

**Sri Lankan artist speaks about death threats by Sinhala extremists**

ඩබ්ලිව්.ඒ. සුනිල් විසිනි
2008 මාර්තු 28

ආන්ඩුවට අයිති ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ (ශ්‍රීලංරූස) සේවක වර්ජනය මර්දනය කිරීම සඳහා මාර්තු 17 ශ්‍රී ලංකා ජනාධිපති මහින්ද රාජපක්ෂ මිලිටරියට උපදෙස් දුන්නේ ය. මෙය ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එල්ල කෙරුන බරපතල පහරකි. ඉන් දෙදිනකට පසු, ඔහු සංස්ථාවේ පරිපාලනය අධීක්ෂනය කිරීමට විශ්‍රාමික හමුදා නිලධාරියෙකු පත්කලේ ය.

පසුගිය දෙසැම්බර් මාසයේ, ඇමතිවරයෙකු සහ ඔහුගේ මැරයන් සම්බන්ධ වූ ප්‍රචන්ඩ සිදුවීමකින් පසුව එල්ල කෙරුන කායික ප්‍රහාර සහ මරන තර්ජනවලට එරෙහිව ශ්‍රීලංරූස සේවකයන් මාර්තු 17 සිට අඛන්ඩ වැඩ වර්ජනයක් සැලසුම් කර තිබුනි. වරදකරුවන් අත්අඩංගුවට ගැනීම සහ සිද්ධිය සම්බන්ධිතව අඛන්ඩව සිදු කෙරෙන පොලිස් තර්ජන නතර කරන ලෙස ඔවුහු ඉල්ලා සිටියහ.

විරෝධතා උද්ඝෝෂන සහ ආන්ඩුවට ඉදිරිපත් කෙරුන ඵලරහිත ආයාචනා ගනනාවකින් පසුව, ඔවුන්ගේ සාමාජිකයන්ගේ කෝපය වඩවඩා වර්ධනය වන තතු තුල වෘත්තීය සමිතිවලට වර්ජනය කැඳවීමට බල කෙරුනේ ය. වැඩසටහන් නිෂ්පාදකයන්ගේ සංගමය, රූපවාහිනී තාක්ෂන සේවකයන්ගේ සංගමය, නිෂ්පාදන සේවා සේවක සංගමය, රූපවාහිනී සේවක සංගමය සහ ජාතික සේවක සංගමය ඊට ඇතුලත් විය. පාලක ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට සම්බන්ධ ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය ඊට සහාය නොදුන් නමුත් එහි සාමාජිකයෝ වර්ජනයට සහයෝගය දුන්හ.

සේවකයන්ට එරෙහි ප්‍රහාර ආරම්භ කෙරුනේ දෙසැම්බර් 27 කම්කරු ඇමති මර්වින් සිල්වා රූපවාහිනී සංස්ථාවට කඩා වැදීමෙන් පසුව ය. පිළිකුල් සහගත වචනවලින්, දේශපාලන ප්‍රතිවාදියෙකුට සිල්වා විසින් අපවාද කල කතාවක් ප්‍රචාරය නො කිරීම නිසා ඔහුගේ මැරයෝ රූපවාහිනී ප්‍රවෘත්ති අධ්‍යක්ෂට කායිකව පහර දුන්හ. ප්‍රහාරයෙන් කෝපයට පත් මාධ්‍ය සේවකයෝ සිල්වාට පිටවී යාමට ඉඩ නොදී පහරදීම ගැන සමාව ගන්නා ලෙස ඉල්ලා සිටියහ. සිල්වා සහ ඔහුගේ මැරයන් ආරක්ෂා කර ගත්තේ හමුදා කොමාන්ඩෝ භටයන්ගේ මැදිහත් වීමෙන් ය. මහජන පිළිකුල අවුලා ලමින් සහ ආන්ඩුව බරපතල අපහසුතාවකට පත් කරමින් සිද්ධිය සජීවී ලෙස විකාශනය විය.

සිල්වා විනයගත කිරීමට හෝ ඔහුට විරුද්ධව නීතිමය පියවර ගැනීමට කිසිවක් කර නැත. ඒ වෙනුවට සිදු වූයේ අපරාධ පරීක්ෂන දෙපාර්තමේන්තුව සිද්ධිය සම්බන්ධයෙන් ශ්‍රීලංරූස සේවකයන් 21 ගැන පරීක්ෂනයක් ආරම්භ කිරීම ය. ජනවාරි මාසයේ සිට මේ වන විට රූපවාහිනියේ ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියෙකු වන ලාල් හේමන්ත මාවලගේ, සහකාර පුස්තකාලයාධිපතිනි රංජනී අලුත්ගේ සහ ජනතා විමුක්ති පෙරමුනට අනුයුක්ත (ජවිපෙ) රූපවාහිනී සේවක සංගමයේ සභාපති අනුරසිරි හෙට්ටිගේ ට මැරයන් කායිකව පහර දී තිබේ.

සන්නද්ධ හමුදා සහ පොලිස් නිලධාරීන් සියගනනක් සහිතව වර්ජනය දවසේ ආරක්ෂක හමුදා විසින් රූපවාහිනී සංස්ථා පරිශ්‍රය යුද බිමක් බවට පත් කලේය. පාලන කාමරය සියතට ගත් හමුදා සංඥා නිලධාරීන් කන්ඩායමක් ද ඇතුලුව රූපවාහිනී සංස්ථාව ඇතුලත රැකවලට හමුදා භටයන් යෙදවී ය. රූපවාහිනී සංස්ථාවට ඇතුල්වීමට අවසර ලැබුනේ "අත්‍යවශ්‍ය" ලෙස සැලකුනු සුලු පිරිසකට පමනි. හයසියයක් පමන සේවකයන්ට ඇතුල්වීමට ඉඩ නොදී විසිරුවා හරිනු ලැබූහ.

වර්ජනය දෙමල විමුක්ති කොටි සංවිධානයට එරෙහි යලි ආරම්භ කර ඇති යුද්ධයට තර්ජනයක් බව ප්‍රකාශ කරමින් ආන්ඩුව තමන්ගේ මර්දනකාරී ක්‍රියාව යුක්තිසහගත කලේ ය. මාර්තු 17 සවස ජනාධිපති රාජපක්ෂ වෘත්තීය සමිති නායකයන් ඔහුගේ කාර්යාලයට කැඳවූයේ ය. මාධ්‍ය ඇමති, ආරක්ෂක ලේකම් සහ පොලිස්පති පිරිවරාගෙන සිටි රාජපක්ෂ "මාධ්‍ය කොටින්" එල්ටීටීඊයට උදව් කරන බව ප්‍රකාශ කරමින් මාධ්‍ය කඩාකප්පල් නොකරන ලෙස වෘත්තීය සමිතිවලට අනතුරු ඇඟවීය.

රාජපක්ෂගේ ප්‍රකෝපකාරී චෝදනාවලට හෝ රූපවාහිනී සංස්ථාව තුල හමුදා භටයන් රඳවා සිටීම ගැන කිසිදු වෘත්තීය සමිති නායකයෙක් අභියෝග නොකලේ ය. දෙසැම්බර් 27 සිට සන්නද්ධ හමුදා භටයන් යොදවා සිටි අතර මාර්තු 17 එම සංඛ්‍යාව

තවත් වැඩි කලේ ය. සේවකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම පිලිබඳ ජනාධිපතිගේ වැදගැම්මකට නැති පොරොන්දු පිලිගත් සමිති නායකයෝ වර්ජනය අත්හිටවූහ. සමිති නායකයන්ගේ පසුබැස්මෙන් ධෛර්යය ලබාගත් රාජපක්ෂ, රූපවාහිනී පරිපාලනය අධීක්ෂනය කිරීම සඳහා අලුතෙන් නිර්මානය කල අතිරේක අධ්‍යක්ෂ ජනරාල් තනතුරට මාර්තු 19 විශ්‍රාමික හමුදා ජනරාල් සුනිල් සිල්වා පත් කලේ ය.

රූපවාහිනී සංස්ථා සේවකයන්ගේ විරෝධතාවයෙන් පිරිහෙන ජීවන තත්වයන් හා ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් මර්දනය කිරීම කෙරෙහි කම්කරු පන්තියේ සෙසු කොටස්වල විරුද්ධත්වයට ජවය සැපයීමක් සිදුවනු ඇතැයි ආන්ඩුව තැතිගෙන තිබේ. ආන්ඩුවේ දැවැන්ත යුදවියදම සහ ජාත්‍යන්තර උද්ධමන පීඩනය නිසා බඩුමිල ඉහල යාම වඩවඩා වර්ධනය වන සමාජ අතෘප්තියක් නිර්මානය කරමින් තිබේ. පසුගිය වසරේ, ආන්ඩුවේ ගුරුවරුන්ගේ, සෞඛ්‍ය සේවකයන්ගේ සහ රාජ්‍ය අංශයේ සෙසු සේවකයන්ගේ ප්‍රධාන අරගල පැනනැගුනි. යුද්ධය ආරක්ෂා කිරීමේ, දේශපාලන විරුද්ධවාදීන්ට අපහාස කිරීමේ සහ කම්කරු පන්තියට සහ ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන්ට එරෙහි එල්ල කෙරෙන ආන්ඩුවේ ප්‍රහාර යුක්ති සහගත කිරීමේදී රාජ්‍යයට අයත් රූපවාහිනී සංස්ථාව වැදගත් ප්‍රචාරක මාධ්‍යයක් නිසා රූපවාහිනී සංස්ථාවේ සේවකයන්ගේ විරෝධතා ව්‍යාපාරය සම්බන්ධයෙන් රාජපක්ෂ විශේෂයෙන් සැලකිලිමත් වෙයි.

රූපවාහිනී සංස්ථාවේ වෘත්තීය සමිතිවල යටත්වීම සෘජුව ම ගලාගෙන එන්නේ යලි ආරම්භ කල වාර්ගික යුද්ධයට ඔවුන්ගේ සහයෝගය ලබා දීමෙන් ය. විශේෂයෙන්ම ජවිපෙය එල්ටීටීඊයේ මිලිටරි ධාරිතාවය විනාශ කිරීමේ ධාවනය වේගවත් කිරීමට පක්ෂපාතී වෙමින් යුද ප්‍රයත්නය සඳහා පරිත්‍යාග කරන ලෙස ඉල්ලා ඇත. ආන්ඩුවේ මර්දනකාරී විධික්‍රම සහ සොල්දාදුවන් යොදාගැනීම විවේචනය කිරීම වෙනුවට වෘත්තීය සමිති නායකයන් ඔවුන්ගේ උද්ඝෝෂනය හුදෙක් සිල්වාට එරෙහි පටු උද්ඝෝෂනයකට සීමා කර තිබේ.

විශේෂයෙන්ම ජවිපෙ වෘත්තීය සමිති නායකයෝ සිල්වාගේ පුද්ගලික නපුරුකම වාචිකව හෙලාදකිමින් ඔහුට දිගටම සහයෝගය දීම ගැන රාජපක්ෂව හෙලා දකිති. එහෙත් ආන්ඩුවට එරෙහිව සාමූහික උද්ඝෝෂනයක් ගෙන නොයන බව ඔවුන් දැනටමත් පෙන්නුම් කර ඇත. ඔවුන්ගේ වෘත්තීය සමිති නායකයාට කායිකව පහර දුන් විට මහ වර්ජනයක් කැඳවන බව ඔවුහු ප්‍රකාශ කලහ. පසුගිය සතියේ විරෝධතා උද්ඝෝෂනය ආරක්ෂක හමුදා විසින් මර්දනය කිරීමෙන් පසුව යොජනාව වහාම අතහැර දැමූහ.

රූපවාහිනී සංස්ථා සේවකයන් ආරක්ෂා කිරීමේ උද්ඝෝෂනය නිදහස් මාධ්‍ය ව්‍යාපාරය (නිමාව්‍යා) සහ වෘත්තීය සමිති කිහිපයක් හා දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සමග එක්ව නව සම සමාජ පක්ෂය (නසසප), එක්සත් සමාජවාදී පක්ෂය වැනි (එසප) රැඩිකල් කන්ඩායම් ආධිපත්‍යය දරන මාධ්‍ය මර්දනයට එරෙහි ව්‍යාපාරයට (මාමඑව්‍යා) යටත් කර ඇත.

පසුගිය වසරේ ආන්ඩුවේ ගුරුවරුන්ගේ වර්ජනයෙන් පසුව එජාපය සමග එක්ව "පලල් පෙරමුනක්" ගොඩනැගීම සඳහා නසසප සහ එසප ය උද්ඝෝෂනය කලහ. ආන්ඩුවට ඔවුන්ගේ ඇති යටත් වීම වසන් කිරීමට, කවර හෝ කාර්මික ක්‍රියාවක් නතර කිරීමට සහ සාමාජිකයන්ගේ විරුද්ධත්වය දියකර දැමීමට මෙම පෙරමුන වෘත්තීය සමිති සඳහා ඉතා හොඳ මාධ්‍යයක් වූයේ ය.

මාධ්‍ය මර්දනයට එරෙහි ව්‍යාපාරය ද එබඳුම භූමිකාවක යෙදී සිටී: මාර්තු 14 ඔවුන් නිකුත් කල ප්‍රකාශයක දී "මාධ්‍ය නිදහස අරක්ෂා කිරීම සඳහා නීතිමය රාමුව වහාම ශක්තිමත් කරන ලෙස" ආන්ඩුවට ආයාචනා කලේ ය. යෝජිත වර්ජනය මර්දනය කිරීම සඳහා මාර්තු 17 හමුදාව යැවීම මගින් රාජපක්ෂ මෙම ආයාචනයට පිලිතුරු දුන්නේ ය.

රූපවාහිනී සංස්ථා සේවකයන්ට එරෙහිව පසුගිය සතියේ සිදු කල මිලිටරි මෙහෙයුම, කවර හෝ විරුද්ධත්වයක් මර්දනය කිරීමට ආන්ඩුව කිසිසේත් ම පසුබට නොවන බවට කම්කරු පන්තියට කල තියුනු අනතුරු ඇඟවීමකි.

© www.wsws.org